# ඔබේ අතේ යතුර ඇතේ



# අනාගතේ ඔබේ අතේ

**හැඳින්වීම :-**

මෙම ලෝකයේ උපත ලබන සෑම මනුෂ්‍යයෙක් තුළම පාහේ, **අනාගතය** ගැන දැනගැනීමට ආසාවක් හෝ කුතුහලයක් ඇතිවීම, සාමාන්‍යයවේ, ස්වභාවිකවේ.

මේ අතර අප බලාපොරොත්තු නොවූ, අප සහ අපගේ පවුලට/සමාජයට/රටට දැඩි ලෙස බලපාන්නා වූ අවස්ථාවක් මැදින් ගමන් කිරීමට යමෙකුට සිදුවුවහොත්, හෙතෙම අනිවාර්යයෙන්ම තම අනාගතය ගැන විමසිලිමත්වීමට, ප්‍රශ්න කිරීමට, සොයා බැලීමට මහත් උනන්දුවක් දක්වනු ඇත.

වර්තමානයේ, එනම් 2020 වසරේ දෙසැම්බර් මාසයේ ලෝකවාසීන් මුහුණදෙමින් සිටින්නේ ඉතා ව්‍යාකූල අර්බුදකාරී අවස්ථාවකටයි. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ, මේ වන විට මුලු ලෝකයම ග්‍රහණය කරගෙන තිබෙන්නාවූ කෝවිඩ් -19 වසංගත රෝගයයි.

මෙම රෝගය වර්තමාන ලෝකයට කෙතරම් බරපතල ලෙස බලපා ඇත්ද කියා පෙනීයන්නේ, මෙලොව ඇති සෑම රටක්ම යන මාර්ගය සහ ගන්නා තීරණ සම්බන්ධයෙන් පවා වැදගත් සාධකයක් වන්නේ, මෙම වසංගත තත්ත්වයයි.

මෙම තත්ත්වය කරණකොටගෙන, අපගේ සිත්වල බොහෝ ප්‍රශ්න පැන නැගී තිබෙන නමුත්, ඒවාට නිවැරදි පිළිතුර තවමත් අපව මඟහරිමින් සිටියි. එබැවින් අප බොහෝ දෙනාගේ හදවත්වල නැගෙන ප්‍රශ්න කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි. ඒවා නම්,

(i) මෙම රෝගය මටත් වැළඳෙයිද ?

(ii) මාගේ අධ්‍යාපනය ඉදිරියට කරගෙන යෑමට මට හැකිවෙයිද ?

(iii) මගේ රැකියාව මට අහිමිවෙයිද ?

(iv) මගේ වයස්ගත දෙමාපියන්ට එය වැළඳී ඔවුන් මෙලොවින් තුරන්වෙයිද ?

(v) අප රටේ ආර්ථිකය කඩා වැටෙයි ද ?

(vi) මෙම රෝගය ලොවින් සහමුලින්ම තුරන් කිරීමට මිනිසාට හැකිවෙයිද ?

(vii) එසේ වුවහොත්, මීට වඩා භයානක වසංගත අනාගතයේ ඇතිවෙයිද ? යන ප්‍රශ්න කිහිපයයි.

ප්‍රිය මිතුර මා මෙසේ ඔබ ඉදිරියේ නගන මේ කිසිම ප්‍රශ්නයකට නිවැරදිව පිළිතුරු ලබාදීමට හැකි ජගතෙක් මෙලොවේ නොමැති බව මාගේ විශ්වාසයයි. මම මෙසේ මහත් විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරන්නේ, එක හේතුවක් නිසා පමණයි. එම හේතුව වන්නේ, **<u>මේ සියලුම ප්‍රශ්න අනාගතය ගැන ප්‍රශ්න වීමයි</u>.**

එනමුත් අනාගත සිදුවීම් ගැන දැනගැනීමේ මාර්ගයක් මනුෂ්‍යයාට සොයාගත හැකිවුවහොත්, පැමිණීමට යන්නාවූ ගැටළු, ප්‍රශ්න සහ අභියෝගවලට කල් වේලා ඇතුව විසඳුම් සොයාගැනීමට මනුෂ්‍යයාට අවස්ථාවක් ලැබෙනු ඇත.

මේ අතර ලෝකයේ අනාගතයේ සිදුවීමට යන්නා වූ සමහර ඉතා වැදගත් සිදුවීම් ගැන මනා අවබෝධයක් ලබා ඇත්තා වූ මා, ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ, ඔබගේ වටිනා කාලයෙන් අඩහෝරාවක් පමණ වැයකර, විවෘත හදවතකින් සහ මනසකින්, මෙම පොතේ අවසානය දක්වා කියවීමටයි.

## 1. <u>අනාගත සිදුවීම් දැනගැනීමට මිනිසාට මගක් තිබෙනවාද ?</u>

අනාගතයේ සිදුවීමට යන්නා වූ දේ ගැන දැනගැනීමේ මාර්ගයක් සොයාගැනීමේ අභිප්‍රායෙන්, අවංකවද, විවෘත හදවතකින් සහ මනසකින් ද, උනන්දුවෙන් ද, යම් කෙනෙක් ක්‍රියා කළහොත්, අනිවාර්යයෙන්ම ලෝකයේ ඇති ප්‍රධාන ආගම් ගැන සොයා බැලීමක් ද ඔහු විසින් කළ යුතු වේ.

මෙසේ ගවේෂණය කරන කෙනෙකුට සමහරවිට පහත සඳහන් පුදුම එළවන ප්‍රකාශන සම්බවිය හැක.

(i) " **<u>මම වනාහී අන්තිමය මුල පටන්ද තවම සිද්ධනූණ දේ පුරාණයේ පටන් දන්වන්නාවූ</u> : මාගේ මන්ත්‍රණ පවත්නේය කියාත් මාගේ මුළු කැමැත්ත ඉෂ්ටකරන්නෙමියි කියාත් කියන්නාවූ <u>තැනන් - වහන්සේය</u>.** "

(ii) " **ස්වාමීන්ගේ මන්ත්‍රණය සදාකාලයටද උන්වහන්සේගේ සිත්හි කල්පනා සියලු පරම්පරාවලටද පවත්නේය.** "

(iii) " **මම මුඩු කඳු මුදුන්වල ගංගාද මිටියාවත් මැද උල්පත් ද විවර කරන්නෙමි. කාන්තාරය දිය පොකුණක් ද වියළි දේශයන් ජල උල්පත් ද කරන්නෙමි. මම කාන්තාරයෙහි කිහිරි ගස්ද, ෂිට්ටීම් ගස්ද, මරඳ ගස්ද තෙල් ගස්ද හිටවන්නෙමි, වනයෙහි දේවදාර ගස්ද, හල් ගස්ද, තෂ්ෂූර් ගස්ද එකට තබන්නෙමි.** "

මෙවැනි විස්මය ජනක, ඇදහිය නොහැකි අනාවැකි යම්කිසි කෙනෙක් ප්‍රකාශකරන විට, සාමාන්‍යයෙන් එම තැනැත්තා ගැන අප පහත සඳහන් නිගමනවලට පැමිණිය හැක.

- මහා බොරුකාරයෙක් නොහොත් රැවටිලිකාරයෙක් හෝ,
- උන්මත්තකයෙක් නොහොත් පිස්සෙක් හෝ,
- සැබවින්ම **<u>අනාගතයේ සිදුවීමට යන්නාවූ දේ දන්නාවූ</u>** කෙනෙක් වන බවයි.

මේ අතර, ඔහු පවසන දේ අප සැමදෙනාගේ, අපගේ රටේ, මුලු ලෝකයාගේ අනාගතය පිළිබඳව බලපාන නිසා ප්‍රඥාවන්ත වූ, බුද්ධිමත් වූ, ඕනෑම කෙනෙක් විසින් කළ යුත්තේ, 'මේ නම් මහා පිස්සෙක්, හෝ මොහු පුදුම බොරුකාරයෙක් ' කියා පවසමින් ඉහත සඳහන් වදන් ක්ෂණිකව ප්‍රතික්ෂේප කර ඉවතලෑම නොවේ.

ඒ වෙනුවට ප්‍රඥාවන්ත වූ, බුද්ධිමත් වූ, අප විසින් කළ යුත්තේ, මොහු කවුද ? ඔහු ප්‍රකාශකර ඇත්තා වූ වෙනත් අනාවැකි තිබෙනවාද ? ඔහු අනාගතය ගැන කීවාවූ දේ ඉටුවී තිබෙනවාද ? කියා සොයා බැලීමයි. එබැවින් මෙය කියවන ඔබ සැමට මා ඉතා ආදරයෙන් ඇරයුම් කරන්නේ, ඉහත සඳහන් ප්‍රශ්න සහ අදාල වෙනත් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම උදෙසා මා සමඟ එකතුවන ලෙසයි.

## 2. <u>මෙම තැනැත්තා ගැන අප ඇසිය යුතු ප්‍රශ්න සමහරක් සහ ඒවාට පිළිතුරු</u>

(i) <u>පළමුවෙනි ප්‍රශ්නය</u> - **මොහු කවුද ?**

<u>පිළිතුර</u> - මොහු **ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්වහන්සේ** වන අතර උන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට බොහෝ අනාවැකි ලබාදුන්සේක. උන්වහන්සේ එසේ කිරීම උදෙසා උන්වහන්සේ විසින් තෝරාගනු ලැබූවාවූ ' **අනාගතවක්තෘ-වරුන්** ' පත්කර, ' **ඉශ්‍රායෙල් වරුන්ගේ ශුද්ධ ලියවිල්ලේ** ' බොහෝ අනාවැකි ලියැවීම උදෙසා ඔවුන් තුළින් ක්‍රියා කළසේක.

(ii) <u>දෙවැනි ප්‍රශ්නය</u> - **ඔහු ලබාදුන් අනාවැකි මොනවාද ?**

<u>පිළිතුර</u> - උන්වහන්සේ අනාගතවක්තෘවරුන් මගින් බොහෝ අනාවැකි ලබාදුන් අතර, ඒවා සියල්ල ලිවීමට මෙම පොත් පිංච නොසෑහේ. එබැවින් ඉතා වැදගත් වන්නාවූ එකක් පමණක් ඔබ ඉදිරියේ තබන්නෙමි. එය ඉශ්‍රායෙල්වරු දෙවියන්වහන්සේට අකීකරු වුවහොත්, ඔවුන්ට ලැබෙන්ට යන්නාවූ දඬුවම පිළිබඳව අනාවැකියකි.

**ද්විතීය කථාව 28 : 64 a :-**

" **පොළොවේ එක් කෙළවරක පටන් අනික් කෙළවර දක්වා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරෙහි ස්වාමීන්වහන්සේ නුඹ විසුරුවා දමනසේක .....** "

මෙම අනාවැකිය රෝම ජාතිකයෙක් වූ තීතස්ගේ, එනම් ටයිටස්ගේ නායකත්වය යටතේ ක්‍රි. ව. 70 දී සහමුලින්ම ඉටුකරන ලදී. එදා රෝම අධිරාජ්‍යය විසින් යෙරුසලමේ දේවමාළිගාව විනාශකොට ඉශ්‍රායෙල්වරුන්ගෙන් අති බහුතරයක්, තම දේශයෙන් පලවා හරින ලදී. ඒ අනුව ඉශ්‍රායෙල් ජාතිය ' **සියලු මනුෂ්‍ය වර්ගයන් අතරෙහි** ' විසුරවනු ලැබූහ. මෙසේ <u>විසුරුවනු ලැබූ ඉශ්‍රායෙල් සෙනඟ නැවත වරක් ඔවුන්ගේම දේශය වෙත එකතුකර ගැනීම පිළිබඳව දෙවියන්වහන්සේ ලබාදුන් අනාවැකියක්</u> මෙහිදී සඳහන් කිරීම ඉතා වැදගත් වේ.

**යෙසායා 11 : 12 :-**

**" උන්වහන්සේ ජාතීන්ට කොඩියක් ඔසවා, පන්වනු ලැබූ ඉශ්‍රායෙල්වරුන් රැස්කර, <u>විසුරුවනු ලැබූ යුදාවරුන් පොළොවේ සතර කොනින් එකතු කරනසේක</u>. "**

**යෙසායා 43 : 5 - 7 :-**

**" [5] භය නොවෙන්න, මක්නිසාද මම නුඹ සමග සිටිමි. නුඹේ වංශය නැගෙනහිරින් ගෙනෙන්නෙමි, බස්නාහිරින් ද නුඹ රැස්කරන්නෙමි,**
**[6] .... <u>දුර සිට මාගේ පුත්‍රයන්ද පොළොවේ කෙළවරින් මාගේ දූවරුන් ද</u>,**
**[7] .... <u>ගෙනෙන්නැයි කියාත් කියන්නෙමි</u>. "**

**<u>ඉහත සඳහන් අනාවැකි ඉටුවීම</u>**

මෙම අනාවැකිය කිසිමදාක කිසි අන්දමකට ඉටුවිය නොහැකි අනාවැකියක් බව, සමස්තයක් වශයෙන් ගත්විට **' සැමදෙනා '** සිතූ නමුත් මුලු ලෝකය මහත් විස්මයට පත් කරමින්, 1948 වසරේ මැයි මස 15වන දින, වසර 2000ක පමණ කාලයක් තුළ රටක් නොතිබුනාවූ ඉශ්‍රායෙල් සෙනඟ ස්වාධීන රටක් බවට පත්වුණි. එපමණක් නොව, ඒ සමගම මුළු ලොව පුරා විසිර සිටි ඉශ්‍රායෙල් සෙනඟ, තම දේශය කරා ඉතා උනන්දුවෙන් සංක්‍රමණය කිරීම සීඝ්‍රයෙන් වර්ධනය වුණි. මා ප්‍රිය සොයුර, සොයුරිය මේ මහා පුදුම සිදුවීම ගැන මොහොතක් සිතා බලන්න.

ඉහත සඳහන් **ද්විතීය කථාව පොත** ලියන ලද්දේ ක්‍රි. පූ. 1446 සිට 1406 අතර කාලයේදී බවද, **යෙසායා පොත** ලියන ලද්දේ ක්‍රි. පූ. 701 සිට 681 අතර කාලයේදී බවද විද්වත්හු තහවුරු කරති. ඒ අනුව ක්‍රි. ව. 70 දී ඉශ්‍රායෙල් ජාතිය ලොව පුරා විසිරී යෑමේ අනාවැකිය, ලියන ලද්දේ ක්‍රි. පූ. 1406 පමණ කාලයේදීය.

**එනම් එය සිදුවීමට වසර 1476 ක් පමණ පෙර, ද්විතීය කථාව 28 : 64 a හි මෙම අනාවැකිය ලියන ලදී.** එලෙසම **යෙසායා පොතේ,** ලොව පුරා විසිරී සිටි ඉශ්‍රායෙල් සෙනඟ සතර දිගින් තම දේශය වෙත එකතුකර ගැනීමේ අනාවැකිය, **එසේ වීමට වසර 2600 කට පමණ ප්‍රථමයෙන් ලියන ලදී.**

එබැවින් අපට පෙනීයන්නේ, **ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ අනාගතයේ සිදුවීමට යන්නාවූ දේ දන්නාවූද, අන්තිමය මුල පටන් දන්වන්නාවූද,** දෙවිකෙනෙක් බව පිළිගැනීම නිවැරදි බවයි.

**<u>මේ පිළිබඳව ලෝක ඉතිහාසය අපට උගන්වන දේ</u>**

ලෝක ඉතිහාසය අපට පෙන්වාදෙන්නේ වර්තමානයේ ඕස්ට්‍රේලියානු, නවසීලන්ත, අමෙරිකානු, දකුණු අප්‍රිකානු වැනි ජාතිකයන් ලෙස හඳුන්වන අයගෙන් බහුතරයක්, අතීතයේ මෙම රටවල්වලට සංක්‍රමණය කළ යුරෝපා ජාතිකයින් වන බවයි.

එලෙසම සිංහල ජාතියේ ආරම්භය වූයේ ක්‍රි. පූ. 6වන සියවසේ 700 ක පිරිසක් සමග විජය රජු ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණීමයි. මෙනමුත් ඉහත සඳහන් ජාතිකයෝ කිසිදාක ඔවුන්ගේ '**මව් රටට**' (යුරෝපයට හෝ ඉන්දියාවට) හැරී යාමට උත්සාහ නොකරති. පරම්පරා එකක් හෝ දෙකකට පසු එම '**මව් රට**' අමතක කරති.

එබැවින් ක්‍රි. ව. 70 දී ලොව පුරා විසුරුවන ලද ඉශ්‍රායෙල් ජාතිකයෝ 1948 දී එනම් ඔවුන් විසිරී වසර 1878 කට පසුව **නැවත පැමිණීම මා දකින්නේ, ලෝක ඉතිහාසයේ සිදුවුනාවූ ඉමහත් හාස්කමක් ලෙසයි ; දෙවියන්වහන්සේ විසින් කරන ලද ආශ්චර්යය ක්‍රියාවක් ලෙසයි.**

එබැවින් මා දැන් අදහස් කරන්නේ, අනාගත සිදුවීම් ගැන, ඉශ්‍රායෙල් ජාතියට පෙන්වාදීම උදෙසා දෙවියන්වහන්සේ විසින් යොදාගනු ලැබුවා වූ අද්විතීය නිර්මාණශීලි මාර්ගයක් ඔබට හඳුන්වාදීමටයි.

උන්වහන්සේ යොදාගත් මාර්ගය වූයේ, ඉශ්‍රායෙල් දේශයේ ඇති අස්වැන්න කාලවල් තුන තුළ පැවැත්වීම උදෙසා, <u>ඉශ්‍රායෙල් ජාතියට මංගල්‍යයන් 7ක්</u> ලබාදීමයි.

අප දැන් ඒවා වෙත අපගේ අවධානය යොමු කරමු.

## 3. <u>දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට දුන්නාවූ මංගල්‍යයන් සත</u>

### (i) <u>පාස්කු මංගල්‍යය - ( ලෙවී කථාව 23 : 5)</u>

**ලෙවී 23 : 5 :-**

**" පළමුවෙනි මස <u>දස සතර වෙනි දින</u> ස්වාමීන්වහන්සේගේ පාස්කුව වේ. "**

ඈත අතීතයේ ඉශ්‍රායෙල් සෙනඟ ඔවුන් විසූ කානාන් දේශයේ සිට ඊජිප්තුව වෙත සංක්‍රමණය කළේ, එහි පාලකයා වූ ඵාරාවෝ රජතුමාගේ ආරාධනාව අනුවය. නමුත් කාලයාගේ ඇවෑමෙන් පසු කාලයක බලයට පැමිණි වෙනත් ඵාරාවෝ රජකෙනෙක් ඉශ්‍රායෙල් සෙනඟ වහලුන් බවට පත්කළේය.

මෙම වහල්කමෙන් තම සෙනඟ මුදවාගැනීම උදෙසා, දෙවියන්වහන්සේ බොහෝ පීඩා (වසංගත ඇතුළත්) ඊජිප්තුව වෙත පැමිණීමට සැලැස්වූ අතර, අන්තිම පීඩාවෙන් ඉශ්‍රායෙල් සෙනඟ ගලවාගැනීම උදෙසා දෙවියන්වහන්සේ ඔවුන්ට අණ කළේ, **කැළැල් නොමැති බැටළුවෙකුගේ ලේ (නික්මයාම 12 : 5)** ඔවුන්ගේ නිවෙස්වල ඇතුල්වීමේ දොරටුවේ **(කුරුසියක හැඩයක් දැක්වෙන අයුරින්)** ඉසීමටයි. මෙසේ නොකළ සෑම නිවසකම කුලුඳුලා මෙම පීඩාව හේතුවෙන් මරණයට පත්වුනි. (කරුණාකර **නික්මයාම 12 : 21 - 28** කියවා බලන්න).

මා ප්‍රිය මිතුර, මෙය තේරුම්ගන්න. යේසුස් ක්‍රිස්තුස් - වහන්සේව පාවාදෙනු ලැබුවේ, උන්වහන්සේ තම ගෝලයන් සමඟ පාස්කු මංගල්‍යය පැවැත්වීමේ කාලයේදීය **(මතෙව් 26 : 1, 2)**. එනම් යේසුස්වහන්සේ කුරුසිපත් කරනු ලැබුවේ පාස්කු මංගල්‍යයේ කාලයේදී ය.

මේ අනුව, යේසුස්වහන්සේ කුරුසිපත්වීමට වසර 1440 කට පමණ පෙර දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේගේ කුරුසි පූජාව පාස්කු මංගල්‍යය තුළින් ඉශ්‍රායෙල් ජාතියට සංකේතවත්ව පෙන්වූසේක.

**(ii) මුහුන් නොදැමූ රොටි මංගල්‍යය (ලෙවී කථාව 23 : 6)**

**ලෙවී 23 : 6 :- " එම මස පසළොස් වෙනි දින ස්වාමීන්වහන්සේට මුහුන් නොදැමූ රොටි මංගල්‍යය වන්නේය. සත් දවසක් මුහුන් නැති රොටි කාපල්ලා. "**

පාස්කු මංගල්‍යය පළමුවෙන මස 14 වෙන දින ඇරඹුණු අතර, එම මාසයේ 15 වෙනි දින මුහුන් නොදැමූ රොටි මංගල්‍යය ඇරඹුණි. එහිදී **' සත් දවසක් මුහුන් නැති රොටි කෑමට '** නියෝගකර තිබුනු අතර, මෙහි **' මුහුන් ' සංකේතවත් කරන්නේ පාපයයි. ' සත ' සංකේතවත් කරන්නේ සම්පූර්ණත්වයයි.** එබැවින් මෙම මංගල්‍යයෙන් යේසුස්වහන්සේගේ **පව් රහිත ජීවිතය** සංකේතවත් කරන අතර, එමගින් එය ඉශ්‍රායෙල් සෙනඟව කැඳවන්නේ, පවින් තොරවූ ශුද්ධ ජීවිත ගත කිරීමටයි.

**1 කොරින්ති 5 : 7b, 8 :- " .... කුමක්හෙයින් ද, අපගේ පාස්කුව, එනම් ක්‍රිස්තුස්වහන්සේ, යාග කරන ලද්දේ ය. එබැවින් පරණ මුහුන්වලින්වත් ඊර්ෂ්‍යාවද දුෂ්ටකමද නමැති මුහුන්වලින් නොව අවංකකමද සැබෑකමද නැමැති මුහුන් නුමුසු රොටියෙන් මංගල්‍යය පවත්වමු. "**

**(iii) නාඹුල් ඵල මංගල්‍යය - (ලෙවී කථාව 23 : 10b, 11)**

**ලෙවී 23 : 10b - 11 :- " ..... මා විසින් නුඹලාට දෙන දේශයට නුඹලා අවුත් එහි ගොයම් කපන කල නුඹලාගේ ශස්‍යයෙන් නාඹුල් ඵල මිටිය පූජකයා වෙතට ගෙනෙල්ලා. ඒ මිටිය නුඹලා උදෙසා පිළිගනු ලබන පිණිස ඔහු ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි එය තේව කරන්නේය. සබත් දවසට පසුවදා පූජකයා එය තේවකෙරේවා. "**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට නියෝග කරන්නේ, මිසරයේ වහල්කමින් මිදී ඔවුන් පොරොන්දු දේශයට පැමිණි පසු, එම දේශයේ ගොයම් (යව නොහොත් බාර්ලි) කපන කාලයේ **' නාඹුල් ඵල මිටිය පූජකයා විසින්, සබත් දවසට පසුවදා ස්වාමීන්වහන්සේ ඉදිරියේ තේව කිරීමටයි. '**

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා සහෝදරී, මෙය පැහැදිලිව තේරුම්ගන්න. යේසුස්වහන්සේ කුරුසිපත් කරනු ලැබුවේ **(පාස්කු මංගල්‍යයේ සමය තුළ තිබුනු)** සිකුරාදා දවසේය, එනම් **' මහා සිකුරාදා දවසේදීය. '**

යුදෙව්වරුන්ගේ සබත් දවස වන්නේ සෙනසුරාදාය. එබැවින් යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටුනේ (සබත් දවසට පසුවදාය - **ලෙවී 23 : 11**), එනම් **නාඹුල් ඵල මංගල්‍යය, දවසේදීය, නොහොත් පාස්කු ඉරුදිනයි.**

**1 කොරින්ති 15 : 20 :-**

**" නමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටිනසේක්මය, උන්වහන්සේ <u>සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය</u>. "**

ඉහත සඳහන් මංගල්‍යයන් තුනම පවත්වනු ලබන්නේ, **බාර්ලි අස්වැන්න කපන කාලයේය.** එනම් වසන්ත කාලයේ ය. දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල් ජාතියට පැවැත්වීමට නියෝගකළ ප්‍රථම මංගල්‍යයන් තුනම වසන්ත කාලයේ පවත්වනු ලබන අතර, ඒවා දෙස විමසිල්ලෙන් බලන අපට ඉතා පැහැදිලිව පෙනීයන්නේ, දෙවියන්වහන්සේ ඒවා තුළින් සංකේතවත්ව පෙන්නුම් කළේ, යේසුස්වහන්සේගේ :-

- **පව් රහිත ජීවිතය** (මුහුන් නොදැමූ රොටි මංගල්‍යය)
- **කුරුසි පූජාව** (පාස්කු මංගල්‍යය)
- **මළවුන්ගෙන් නැගිටීම** (නාඹුල් ඵල මංගල්‍යය)

යේසුස්වහන්සේ මෙලොව ඉපදීමට වසර 1406 කට පමණ ප්‍රථමයෙන් ලියන ලද **ලෙවී පොතෙහි** මෙම මංගල්‍යයන් සඳහන් වී තිබීමෙන් අපට පෙනීයන්නේ, දෙවියන්වහන්සේ මෙම මංගල්‍යයන් තුනෙහි **යේසුස්වහන්සේගේ ප්‍රථම පැමිණීමේදී** උන්වහන්සේගේ ජීවිතයේ සිදුවීමට තිබුනාවූ **ඉතාමත් වැදගත්වූ සිදුවීම් තුනක් ' සංකේතවත් අනාවැකි '** ලෙසට අපට ලබා දෙන ලද බවයි.

එබැවින් මා ඔබගෙන් ඉතා ආදරයෙන් ඉල්ලා සිටින්නේ, මෙම ප්‍රශ්නය ඔබගෙන්ම අසා ගන්න කියායි. එම ප්‍රශ්නය වන්නේ, මේ අන්දමට අනාගතයේ සිදුවීමට යන්නාවූ දේ නිර්වද්‍යව එළිදරව් කර ඇති, වෙන කිසිකෙනෙක් ඔබ දන්නවාද ? යන ප්‍රශ්නයයි.

මාගේ මේ ප්‍රශ්නයට මගේම පිළිතුර වන්නේ, ' මම නම් නොදනිමි, එබැවින් මම උන්වහන්සේ කෙරෙහි 100% ක් විශ්වාසය තබමින් ජීවත් වන්නෙමි ' යන පිළිතුරයි.

**(iv) <u>සති</u>** <u>(පෙන්තකොස්ත)</u> **<u>මංගල්‍යය - (ලෙවි 23 : 15, 16)</u>**

නාඹුල් ඵල මංගල්‍යයට දින 50කට පසු දිනයේ ' **සති මංගල්‍යය** ' පැවැත්වීමට දෙවියන්වහන්සේ නියෝග කළ අතර, මේ කාලය වසන්ත කාලයේ අග භාගයේ සිදුවූ **ගෝදුම** (තිරිඟු) කපන කාලය වේ.

යේසුස්වහන්සේ තම ගෝලයන්ට ප්‍රකාශ කළ ආකාරයට, උන්වහන්සේ ස්වර්ගයට නැඟී දින 10කට පසු, එනම් උන්වහන්සේ උත්ථානය වී දින 50කට පසු, <u>කිතුණු සභාව ශුද්ධාත්ම බලයෙන් පිරී, ඉතා සීඝ්‍රයෙන් වර්ධනයවීම ඇරඹුනේ</u> **' සති මංගල්‍යයේදීය. ' (ක්‍රියා 2 : 1 - 4, 41)**

එබැවින් මෙම දවස ග්‍රීක් භාෂාවෙන්, **50 යන අරුත ඇති ' පෙන්තකොස්ත දවස, '** ලෙස කිතුණු සභාව විසින් නම් කර ඇති අතර, පෙන්තකොස්ත දවස වන්නේ, දෙවියන් - වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට ලබා දුන්නාවූ **' සති මංගල්‍යයේ '** දවසයි.

**(v)** දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල් ජාතියට දෙන ලද්දාවූ ඉතිරි මංගල්‍යයන් තුන වන්නේ,

- **හොරණෑ මංගල්‍යය - (ලෙවී 23 : 23, 24)**
- **සමගි කිරීමේ දවස - (ලෙවී 23 : 27)**
- **කූඩාරම් මංගල්‍යය - (ලෙවී 23 : 33, 34)** යන මංගල්‍යයන් තුනයි.

මේ මංගල්‍යයන් තුනම පවත්වනු ලබන්නේ, ඉශ්‍රායෙල් දේශයේ සරත් ඍතුවේ ආරම්භයේ සිදුවෙන්නාවූ අස්වැන්න කාලයෙහිය. එනම්, සැප්තැම්බර් / ඔක්තෝබර් කාලය තුලයි. මේවා ගැන අධ්‍යයනය කර ඇති මා තරයේ විශ්වාසකරන්නේ, **<u>යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම සිදුවීමට යන්නේ, සරත් කාලයේ පැවැත්වීමට දෙවියන්වහන්සේ නියෝගකළ මේ මංගල්‍යය කාලය තුල වන බවයි</u>.**

(කරුණාකර නොවරදවාම **ඉශ්‍රායෙල් අධ්‍යයනය 07** කියවා බලන්න).

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරී, අප මෙතරම් දිගු කාලයක් යොදාගත්තේ, ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ (එනම්, කිතුණුවන් අදහන්නාවූ දෙවියන්වහන්සේ) **' අන්තිමය මුල පටන් ද, තවම සිද්ධනූණ දේ පුරාණයේ පටන් දන්වන්නාවූ '** දෙවියන්වහන්සේ වන බව ඔබට පෙන්වාදීමටයි.

අප ඔබ ඉදිරියේ තැබූවාවූ සත්‍යවූ කරුණු බුද්ධිමත්වූ ඔබ සැම අනිවාර්යයෙන්ම තේරුම්ගත් බව අපගේ විශ්වාසයයි. එබැවින් අප දැන් අනාගතය වෙත අපගේ අවධානය යොමු කරමු.

## 4. <u>මෙම ලෝකයේ අනාගතය ගැන දෙවියන්වහන්සේ එළිදරව් කර ඇත්තාවූ අනාවැකි කිහිපයක්</u>

ගවහලක උපත ලැබූ බිළිඳෙකු ලෙස මෙලොවට බිහිවූ යේසුතුමා අනාගතයේදී රජෙකු මෙන් නැවත ලොවට වඩින සේක. යේසුස්වහන්සේ මෙලොව ගතකළ අවසාන කාලයේදී උන්වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේගෙන් මෙසේ ප්‍රශ්න කළෝය.

**මතෙව් 24 : 3 :-**

**" 3 .... ඔබවහන්සේගේ ඊමටත් ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක්දැයි අපට කිව මැනවැයි කීවෝය. "**

යේසුස්වහන්සේ දුන් දීර්ඝ පිළිතුර **මතෙව් 24 : 4 - 31 දක්වා** සඳහන් වන අතර **මතෙව් 24 : 31** ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**මතෙව් 24 : 31 :-**

**" උන්වහන්සේ මහත් හොරණෑ ශබ්දයක් ඇතුව තමන් දූතයන් එවනසේක, ඔව්හු අහසේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා සතර දිගින්ම උන්වහන්සේගේ තෝරාගත්තවුන් රැස්කරන්නෝය. "**

තවද උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් උන්වහන්සේගේ දෙවැනි පැමිණීමට සූදානම්ව සිටිය යුතු බව ඉගැන්වීම උදෙසා, **' අත්තික්කා ගසේ උපමාව ' (මතෙව් 24 : 32 - 33)** පැවසූසේක.

ඉන් අනතුරුව **" සැබැවක් නුඹලාට කියමි. මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහව නොයන්නේය. " (මතෙව් 24 : 34)** යන අනාවැකිය උන්වහන්සේ ප්‍රකාශ කළසේක.

<u>එමනිසා **' මේ පරම්පරාව '** නිවැරදිව හඳුනාගැනීම ඉතා වැදගත් බැවින්, එසේ කිරීමට අප දූන් උත්සාහ කරමු</u>.

❖ **<u>උන්වහන්සේගේ දෙවැනි පැමිණීම ගැන ( මතෙව් 24 : 4 - 31 දක්වා සහ ලූක් 21 : 8 - 11 දක්වා ) යේසුස්වහන්සේ ප්‍රකාශකළ ලකුණු</u>**

(A) ආගමික මුලාකිරීම් - **(මතෙව් 24 : 4,5,11,24 ; ලූක් 21 : 8)**

(B) යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති - **(මතෙව් 24 : 6 ; ලූක් 21 : 9)**

(C) ජාතීන් අතර, රාජ්‍යයන් අතර මහත් භේද - - **(මතෙව් 24 : 7 ; ලූක් 21 : 10)**

(D) සාගත - **(මතෙව් 24 : 7 ; ලූක් 21 : 11)**

(E) පොළොව් කම්පා - **(මතෙව් 24 :7 ; ලූක් 21 : 11)**

(F) <u>වසංගත</u> - **(ලූක් 21 : 11)**

(G) අහසින් මහත් ලකුණු - **(ලූක් 21 : 11)**

මේ සියලු ලකුණු වර්තමානයේදී සිදුවෙමින් තිබෙන නමුත්, ඒවායින් පමණක් **'මේ පරම්පරාව'** හඳුනාගත නොහැකිවේ.

❖ **ද්විතීය කථාව 28 : 64 a** හි සඳහන් ' **ඉශ්‍රායෙල්වරුන් ලොවපුරා විසිරීම** ' ගැන අනාවැකිය මා ආරම්භයේදීම සඳහන් කළ බැවින්, ඔවුන්ව නැවත තම දේශයට එකතු කිරීම ගැන එම පොතේම දෙවියන්වහන්සේ සඳහන් කර ඇති අනාවැකියක් ඔබ ඉදිරියේ තබන්ට කැමැත්තෙමි.

**ද්විතීය කථාව 30 : 5 :-**

" **නුඹේ පියවරුන් භුක්තිවින්දා වූ දේශය නුඹ විසින් භුක්තිවිඳින පිණිස නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹ එහි පමුණුවා, උන්වහන්සේ නුඹට යහපත කොට නුඹේ පියවරුන්ට වඩා නුඹ වැඩි කරනසේක.** "

මෙම අනාවැකිය, ලියා තිබෙන අයුරින් ඉටුවේයයි, වසර 150 කට පමණ පෙර කිසි මනුෂ්‍යයෙක් නොසිතන්නට ඇත. එනමුත් අප කලින් සඳහන් කළ අන්දමින්, මුලු ලොවම මවිතයට පත් කරමින් 1948 වසරේදී ඉශ්‍රායෙල් ජාතිය, නැවත වරක් රටක් / දේශයක් ලෙස පිළිගන්නා ලදී.

<u>එබැවින් මාගේ නිගමනය වන්නේ **1948 දී මේ පරම්පරාව** ආරම්භ වූ බවයි</u>. තවද, ඉහත මා සඳහන් කළ (A, B, C, D, E, F, G) යන **ලකුණු ද** මෙම පරම්පරාව තුළ වර්ධනයවෙමින් පැවතීම, මාගේ නිගමනය සනාථ කරන සාධකයක් වන බවයි.

❖ ' <u>**පරම්පරාවක්** ' **යනුවෙන් බයිබලයේ අදහස් කරනු ලබන්නේ, වසර කොපමණක් ද ? කියා විමසා බැලීම**</u>

**ගීතාවලිය 90 : 10 :-** " **අපේ ජීවිතවල දවස් අවුරුදු හැත්තෑවක්ය, ශක්තිය ඇත්නම් අවුරුදු අසූවක් ය.** "

**ගීතාවලිය 90 : 10** අනුව, ' **පරම්පරාවක් පහව යෑම** ' **(මතෙව් 24 : 34)** උදෙසා අවුරුදු 80 ක් ගතවන බව අපට සිතිය හැකිය. මෙනමුත් 2013 සිට කෝවිඩ්-19 වසංගතය ඇතිවන තෙක්, වසරකට දෙවතාවක් සේවය උදෙසා ඉශ්‍රායෙල් දේශයට ගමන් කර ඇති මා නිරීක්ෂණය කර ඇත්තේ බොහෝ යුදෙව්වරුන් වසර 90කට ආසන්න හෝ ඊටත් වැඩි කාලයක් ජීවත්වන බවයි.

එබැවින් **ගීතාවලිය 90 : 10** තුළින් පරම්පරාවක් වසර **80 ක්** ලෙස සැලකිය හැකි නමුත්, එය වසර **100 ක්** ලෙස සැලකීම වඩා යෝග්‍ය වන බව සමහරෙක් සිතන්නට/යෝජනා කරන්නට පුළුවන. එමනිසා මෙම අදහස් දෙකම සැලකිල්ලට ගනිමින්, අපි ඉදිරියට යමු.

**(i) <u>පරම්පරාවක් වසර 80 ක් ලෙස සැලකීම</u>**

මෙම නිගමනය නිවැරදි වන්නේ නම්, (1948 + 80) = 2028 දී හෝ ඊට පෙර යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම සිදුවනු ඇත.

මේ අතර දේව වචනය මහත් යාච්ඤාවෙන් අධ්‍යයනය කරන අපට පෙනීයන්නේ යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමට වසර 7 කට පමණ පෙර, උන්වහන්සේ සැබෑ ඇදහිලිවන්තයන්ව **වලාකුළු වලින් අහසට ඇදගැනීමට යන බවයි (1 තෙසලෝනික 4 : 17).**

ඉහත සඳහන් අපගේ උපකල්පන නිවැරදි වන්නේ නම්, 2021 වසරේදී මෙය සිදුවනු ඇත.

**(ii) <u>පරම්පරාවක් වසර 100 ක් ලෙස සැලකීම</u>**

මෙය නිවැරදි වන්නේ නම්, 2041 වසරේදී හෝ ඊට පෙර දේව දරුවන්ව අහසට ඇදගැනීම සිදුවනු ඇත. මාගේ ප්‍රේමවන්ත දේව දරුව, මෙය තදින් අල්ලාගන්න. අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, උන්වහන්සේගේ දෙවැනි පැමිණීම ගැන ලකුණු එදා ගෝලයන්ට ප්‍රකාශ කිරීම අවසන් කළේ පහත සඳහන් වචන වලිනි.

**මතෙව් 24 : 42 - 44 :-**

**" [42] <u>එබැවින් අවදිව සිටපල්ලා</u>. මක්නිසාද නුඹලාගේ ස්වාමියා කොයි දවසක එනසේක්දැයි නුඹලා දන්නේ නැත. [43] ......**

**[44] <u>එබැවින් නුඹලාත් සෑදී සිටපල්ලා</u>. <u>මක්නිසාද නුඹලා නොසිතන පැයක දී මනුෂ්‍ය පුත්‍රයා එනසේක</u>. "**

මේ අතර යේසුස්වහන්සේ ඉගැන්වූ '**අත්තික්කා ගසේ උපමාව**' එලෙසම ඉටුවන බව නිශ්චිත වේ. එබැවින් එය දැන් සම්පූර්ණයෙන්ම කියවා බලමු.

**මතෙව් 24 : 32 - 36 :-**

**" 32 අත්තික්කා ගහේ උපමාව ඉගෙන ගනිල්ලා. <u>එහි අතු මෘදුව කොළ හටගත්ත කල ග්‍රීෂ්ම කාලය ළඟ බව නුඹලා දන්නහුය</u>.**
**33 එසේම නුඹලා මේ සියල්ල දකින කල, උන්වහන්සේ දොරටු සමීපයේ බවත් දැනගනිල්ලා.**
**34 සැබැවක් නුඹලාට කියමි. මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහව නොයන්නේය.**
**35 <u>අහසත් පොළොවත් පහව යන්නේය</u>. <u>නුමුත් මාගේ වචන පහව නොයන්නේය</u>.**
**36 නුමුත් <u>ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ මිස දන්නා කෙනෙක් නැත</u>. ස්වර්ගයේ දේව දූතයන්වත් මනුෂ්‍ය පුත්‍රයාවත් දන්නේ නැත. "**

සැබවින්ම යේසුස්වහන්සේ ප්‍රකාශ කළ අන්දමට උන්වහන්සේගේ දෙවැනි පැමිණීමේ '**දවස හා පැය**' දන්නේ දෙවියන්වහන්සේ පමණක් ය. මෙනමුත් එම කාලය ඉතා ළංව තිබෙන බව අප සැවොම දන්නෙමු. '**ග්‍රීෂ්ම කාලය ළඟ බව නුඹලා දන්නාහුය.**' **(මතෙව් 24 : 32)**

එබැවින් කිසිම සුදුසුකමක් නොමැති මා ඉතා යටහත්ව ඔබ සැමගෙන් ඉල්ලා සිටින්නේ මෙම පොත් පිංචෙහි ලියා ඇති සියලු කරුණු සැලකිල්ලට ගනිමින්, '**යේසුස්වහන්සේ අප උන්වහන්සේ වෙත අහසට ඇදගැනීම, 2021 වසරේ සරත් කාලයේ** (හෝ ඊට පෙර) **සිදුවුනත් නැති වුනත් සැමවිටම අවදිව සිටිමින්, සැමවිටම එය උදෙසා සූදානම්ව, ශුද්ධවූ ජීවිත ගත කරන්න කියායි.**'

*එලෙසම, ඔබ සැමගෙන් මා වැඩි දුරටත් ඉල්ලා සිටින්නේ, මෙම පොත් පිංචෙහි සඳහන් කරුණු, පමා නොවී අන් අය සමගත් බෙදා ගන්න කියායි.*

**එසේ කිරීමට දෙවි ස්වාමීන්වහන්සේ ඔබ සැමට, ඇදහිල්ල, ධෛර්‍යය, ශක්තිය සහ මඟපෙන්වීම ලබා දෙනසේක්වා !!!**

## **විශේෂ පණිවිඩයක් !!**

මෙම පොතේ ඉතිරි කොටස අප විසින් ලියනු ලබන්නේ **' අහසට ඇදගනු නොලැබූ සැමදෙනා '** උදෙසාය.

මාගේ ආදරණීය සොයුරු සොයුරියනි, මෙම පොත ඔබට ලැබී ඇත්තේ, ඔබව මැව්වා වූ ඔබට බොහෝසේ ප්‍රේමකරන දෙවි කෙනෙක් සිටින නිසයි. උන්වහන්සේ කිසිකෙනෙක් විනාශ වනවාට නොකැමතිවනසේක. උන්වහන්සේගේ කැමැත්ත වන්නේ **' සියල්ලන්ම පසුතැවිලිවී උන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමයි. ' (2 පේත්‍රුස් 3 : 9)**

එබැවින් මෙම කොටසේ මා ඉතා ලුහුඬින් සඳහන් කිරීමට යන්නේ, බයිබලයේ සඳහන් වී ඇත්තාවූ අනාගතයේ සිදුවීමට යන්නාවූ කරුණු කිහිපයක් පමණකි.

(i) **ඉශ්‍රායෙල් දේශය සහ බොහෝ අරාබි රටවල් අතර වසර 7ක සාම ගිවිසුමක් අත්සන් කරනු ලැබෙනවා ඇත (දානියෙල් 9 : 27)**

මෙම ගිවිසුම ඇතිකිරීම උදෙසා මැදිහත් වන්නාවූ නායකයා, බොහෝවිට **' සිරියානු ජාතිකයෙක් '** වීමට යන බව, **' දානියෙල් පොත '** අධ්‍යයනය කළාවූ මාගේ මතයයි.

(මා ඉහත සඳහන් කළ ආකාරයට මෙය සිදුවුවහොත්, මෙම කොටසේ මා ලියන සියල්ල ද අනිවාර්යයෙන් ම සිදුවනු ඇත. එබැවින් කරුණාකර මේ සාම ගිවිසුම ගැන අවදානයෙන් සිටින්න).

(ii) මෙම වසර 7ක සාම ගිවිසුම ඇතිකිරීම උදෙසා මැදිහත් වෙන්නා වූ තැනැත්තා, **සාම කුමාරයෙක්** ලෙස පෙනී සිටින්නා වූ නමුත්, ඔහු, **ක්‍රිස්තුවිරෝධී** කෙනෙක් වේ. මෙම සාම ගිවිසුම ඇතිවීම සමඟ, බොහෝවිට යෙරුසලමේ දේව මාළිගාව නැවත ගොඩනැගීම ඇරඹීම සිදුවිය හැක.

එය ගොඩනැගීමෙන් පසු, සාම ගිවිසුමට ඇතුල්වී වසර 3 ½ කට පසු, මෙම **ව්‍යාජ සාම කුමාරයා** දේව මාළිගාවේ **යාගයත් ආහාර පූජාවත් නවත්වන්නේය (දානියෙල් 9 : 27).**

(iii) මෙම නායකයාගේ රූපයක් සාදා එය දේව මාළිගාව තුළ (in a wing of the temple - **Daniel 9:27** - NIV) තබනු ඇත.

එයට නමස්කාර නොකරන සියල්ලන්ව මරා දැමීමට පවා බලය ඔහු ලබන්ට යන අතර, **(එළිදරව් 13 : 15)**, තමාගේ දකුණතේ හෝ නළලේ එම නායකයාගේ සලකුණ නොලැබූ කිසිවෙකුට මිලේට ගන්ටවත් විකුණන්ටවත් නොහැකි වනු ඇත **(එළිදරව් 13 : 17)**. මෙම නායකයාගේ ගණන හයසිය හැට හයකි.

**එළිදරව් 13 : 18 :-**

**" ..... නුවණ ඇත්තා මෘගයාගේ ගණන ගණන් කරාවා, මක්නිසාද ඒක මනුෂ්‍යයෙකුගේ ගණනක් ය. උගේ ගණනද හයසිය හැට හයක් ය. "**

(iv) ඉහත සඳහන් වසර 7 අවසානයේදී මහා ලෝක යුද්ධයක් ඇතිවෙන්ට යන අතර, යේසුස්වහන්සේ එවිට රජතුමෙකු මෙන් මෙලොවට පැමිණ, සියලු සතුරු හමුදාවන් විනාශ කරන සේක **(එළිදරව් 19:11-21)**. මෙම යුද්ධයට **නැගෙනහිර දිසාවෙන් එන රජුන් පැමිණෙන බව (එළිදරව් 16:12)** සඳහන් වී තිබීම (වර්තමානයේ දී ලෝකයේ සිදුවෙමින් තිබෙන්නා වූ බල අරගලය නිසා) මා දකින්නේ ඉතා සුවිශේෂ කරුණක් ලෙසයි.

මා ප්‍රිය මිතුරු මිතුරියනි, මෙය හොඳහැටි වටහා ගන්න. මෙම ලෝකයේ අන්තිම වසර 3½ ඉතා බිහිසුණු, අනතුරුදායක, පීඩා කාලයක් වීමට යන බව බයිබලයේ සඳහන් වී තිබේ. ඒ බව ඔබට දැනුම් දීම මාගේ වගකීමක් ලෙස සලකමින්, ඔබට මෙසේ පවසමි.

**<u>ඔබගේ අනාගතය ඇත්තේ ඔබගේ අතේය.</u>**

එය ගැන නිවැරදි තීරණයක් ගත හැක්කේ ඔබට පමණය. වෙන කිසිවෙකුට ඔබ වෙනුවෙන් ඔබගේ අනාගතය ගැන **තීරණය කළ නොහැකිවේ.** එබැවින් මා ඉතා ගෞරවයෙන් ඔබ ඉදිරියේ ප්‍රශ්නයක් තබමි.

එම ප්‍රශ්නය වන්නේ -

**ඔබ ඔබගේ අනාගතය ගත කිරීමට කැමති වන්නේ, ඔබව මැව්වාවූ ඔබට ප්‍රේම කරන්නාවූ (දෙවියන්වහන්සේ සමඟ) උන්වහන්සේගේ රාජ්‍යයේ ද, නොමැතිනම් වෙනත් ස්ථානයක ද?** යන ප්‍රශ්නයයි.

මා ඉතා ආදරයෙන්ද, යටහත්වද මහත් ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ, මාගේ ප්‍රශ්නයට අවංකව පිළිතුරු දෙමින්, ඒ අනුව ක්‍රියා කරන ලෙසයි.

අවසාන වශයෙන් ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේගේ හදවත ඔබ දකින පිණිස උන්වහන්සේ පවසා ඇති වදන් 2ක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**එසකියෙල් 18 : 23 :-**

**" දුෂ්ටයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත් වනවාට මිස නසිනවාට කොයි ප්‍රකාරයකින්වත් මාගේ ප්‍රසන්නයක් ඇත්දැයි ස්වාමී වූ දෙවියන්වහන්සේ කියනසේක. "**

**එසකියෙල් 18 : 31 :-**

**" නුඹලා කළ නුඹලාගේ සියලු වරද නුඹලා වෙතින් අහකදමා, අලුත් සිතක් ද අලුත් ආත්මයක් ද, නුඹලාටම සදාගනිල්ලා. "**

## ඔබ සැමට යේසු පිහිටයි !!




www.sinhalabiblestudy.com